සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

25B S I

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2018
Third Term Test - Grade 13 - 2018

විභාග අංකය ............................ **යුරෝපා ඉතිහාසය I** කාලය පැය තුනයි

උපදෙස්

- මෙම කොටසේ ප්‍රශ්න 40 ක් ඇත. සියළු ප්‍රශ්න වලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර පහක් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ එයින් එකක් පමණි. ප්‍රශ්නයට නිවැරදි පිළිතුර වශයෙන් ඔබ එක් ප්‍රතිචාරයක් තෝරාගත් පසු එය දක්වා ඇති උපදෙස් පරිදි ලකුණු කරන්න.
- I කොටසට පිළිතුරු ලියා අවසන් වූ පසු II කොටසේ පිළිතුරු පත් සමඟ අමුණා භාර දෙන්න.

## I කොටස

◈ **අංක 01 සිට 10 ඇති ප්‍රශ්න සඳහා දී ඇති නම් පහෙන් එකක් අනෙක් නම් සමග නොගැළපේ. එම නොගැළපෙන නමෙහි අංකය වරහන තුළ ලියන්න.**

01. 1. හෙලනීවරු 2. ඔස්ට්‍රොගොත්වරු 3. ලොම්බාර්ඩ්වරු
4. ෆ්‍රැන්ක්වරු 5. ඇංග්ලෝ සැක්සන්වරු (.....)

02. 1. ඊස්කිලස් 2. සොෆොක්ලීස් 3. යුරිපිඩීස්
4. හෝමර් 5. වර්ජිල් (.....)

03. 1. අලි 2. හාරෝන් 3. අල්රෂීඩ්
4. කෙරෝ 5. ශීමාර් (.....)

04. 1. ලොයිඩ් ජෝර්ජ් 2. ජෝර්ජ් කලෙමන්ෂෝ 3. වුඩ්රෝ විල්සන්
4. හිට්ලර් 5. ඕර්ලෑන්ඩෝ (.....)

05. 1. මැසිනි 2. චාල්ස් ඇල්බට් 3. ගැරිබෝල්ඩ්
4. කැවුවර් 5. මෙටර්නික් (.....)

06. 1. 2 වෙනි ජුලියස් 2. 10 වැනි ලියෝ 3. 6 වැනි එඩ්‍රියන්
4. 2 වැනි කැතරින් 5. 7 වැනි ක්ලෙමන්ට් (.....)

07. 1. 8 හෙන්රි 2. ෆ්‍රැන්සිස් ඩ්‍රෙක් 3. 6 එඩ්වඩ්
4. 1 එලිසබෙත් 5. 1 ජේම්ස් (.....)

08. 1. ඇඩ්‍රියානෝපල් ගිවිසුම 2. කැම්පොෆෝර්මියෝ ගිවිසුම
3. ඒමියන්ස් ගිවිසුම 4. ලුනෙවිල් ගිවිසුම
5. ටිල්සිට් ගිවිසුම (.....)

09. 1. වෙනීසිය 2. මිලාන් 3. ප්ලොරන්ස්
4. මෙඩිචි 5. නේපල්ස් (.....)

10. 1. තේලීස් 2. සොක්‍රටීස් 3. ප්ලේටෝ
4. ඇනෙක්සිමැන්ඩර් 5. ඩිමෝක්‍රටස් (.....)

- **අංක 11 සිට 15 තෙක් ප්‍රශ්න වල දී ඇති පද යුගල වලින් එක යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැලපෙන යුගලයෙහි අංකය වරහන තුළ ලියන්න.**

11. 1. මයිරන් - බොක්සිං ක්‍රීඩකයා
2. ප්‍රැක්සිටිලීස් - හර්මීස්ගේ ප්‍රතිමාව
3. පීඩියස් - ජුපිටර් දෙවියන්ගේ ප්‍රතිමාව
4. පොලිග්‍රෝටස් - මැටි බඳුන් නිර්මාණය
5. ඉක්ටිනස් - ඩයෝනීසියස් රඟ මඩල (.....)

12. 1. පාර්තිනෝන් - ඇතන්ස්
2. ක්‍රෙම්ලින් - මොස්කව්
3. ශාන්ත පීටර් බැසිලිකාව - ජර්මනිය
4. කොලෝසියම් - රෝමය
5. අයිෆල් කුලුන - පැරිස් (.....)

13. 1. තිස් අවුරුදු යුද්ධය - ගුස්ටාවුස් ඇඩොල්පස්
2. සත් අවුරුදු යුද්ධය - 15 වැනි ලූවී
3. වෝටර්ලු සටන - නැපෝලියන් බොනපාට්
4. ක්‍රිමියන් යුද්ධය - දෙවැනි ඇලෙක්සැන්ඩර්
5. සොල්ෆෝරිනෝ සටන - දෙවැනි නැපෝලියන් (.....)

14. 1. වුඩ්රෝ විල්සන් - ජාතීන්ගේ සංගමය පිළිබඳ සංකල්පය
2. පර්ඩිනන්ඩ් ඉසබෙලා - ස්පාඤ්ඤය එක්සත් කිරීම.
3. රිචලියු - නැන්ටීස් ආඥාව පැනවීම.
4. මැසිනි - ඉතාලිය එක්සත් කිරීම.
5. ට්‍රොට්ස්කි - බෝල්ෂෙවික් විප්ලවයට දායකවීම. (.....)

15. 1. මැකියාවෙලි - කුමරායා
2. මොන්ටෙස්කියු - ජාතීන්ගේ ධනය
3. ඇඩම්ස්මිත් - ප්‍රජාතන්ත්‍රවාදය
4. රූසෝ - දාස් කැපිටාල්
5. කාල්මාක්ස් - නීතියේ සාරය (.....)

- **අංක 16 - 25 තෙක් වූ ප්‍රශ්නය සඳහා x හා y තීරුවල නාම/ප්‍රකාශන/දින වකවානු දී ඇත. x හා y තීරු ගැළපෙන අනුපිළිවෙළට සකස්කළ විට පහත දී ඇති සංකේත පහෙන් එකක් නිවැරදිය. එම නිවරදි අංකය තෝරා වරහන තුළ යොදන්න.**

16.

| X | Y |
|---|---|
| 1. වර්සෙල්ස් ගිවිසුම | A හංගේරියාව |
| 2. ශාන්ත පර්මෙන් ගිවිසුම | B ඔස්ට්‍රියාව |
| 3. ට්‍රියනොන් ගිවිසුම | C තුර්කිය |
| 4. නියුලි ගිවිසුම | D ජර්මනිය |
| 5. ලොසැන් ගිවිසුම | E බල්ගේරියාව |

1. DCBAE 2. DBAEC 3. EDACB
4. BEACB 5. CEABD (.....)

17.

| X | Y |
|---|---|
| 1. එංගලන්තය | A බූර්බෝන් |
| 2. ප්‍රංශය | B හැප්ස්බර්ග් |
| 3. ජර්මනිය | C ඔරේන්ජ් |
| 4. ඕලන්දය | D හොන්සොලර්න් |
| 5. ප්‍රසියාව | E ටියුඩර් |

1. EABCE 2. ABCED 3. DBCAE
4. BCDEA 5. CABDE (.....)

18.

| X | Y |
|---|---|
| 1. ජේම්ස් හාග්‍රේව්ස් | A කොට්න් ජින් |
| 2. එලිවිට්නි | B වාෂ්ප එන්ජිම |
| 3. තෝමස් නිව්කොමන් | C ජල රාමුව |
| 4. රිචඩ් ආක්රයිට් | D ස්පිනිං මියුල් |
| 5. සැමුවෙල් ක්‍රොම්ප්ටන් | E ස්පිනිං ජෙනි |

1. EABCD 2. EACDB 3. EADBC
4. EABDC 5. EACBD (.....)

19.

| X | Y |
|---|---|
| 1. දුප්පතුන්ට දානය පිරිනැමීම | A චාලිමෙන් අධිරාජ්‍යයා |
| 2. පළමු ශුද්ධ රෝම අධිරාජ්‍යා | B සක්වාන් |
| 3. මිලාන් ආඥාව | C අබුබකර් |
| 4. මහමද්තුමාගෙන් පසු පැමිණි අනුප්‍රාප්තිකයා | D අපොස්තලුවරුන් |
| 5. යුදෙව්වන්ට ධර්මය දේශනා කිරීම | E කොන්ස්ටන්ටයින් අධිරාජ්‍යයා |

1. ADBEC 2. BAEDC 3. BAECD
4. EBACD 5. ABDCE (.....)

20.

| X | Y |
|---|---|
| 1. ජුවානා + v වැනි චාල්ස් | A පියා සහ පුතා |
| 2. vii හෙන්රි + 8 වැනි හෙන්රි | B සහෝදරියෝ |
| 3. මේරි ටියුඩර් + පළමු වැනි එළිසබෙත් | C ඥාති සම්බන්ධයක් නැත |
| 4. ii ඇලෙක්සැන්ඩර් + iii ඇලෙක්සැන්ඩර් | D සහෝදරයෝ |
| 5. මෙටර්නික් + බිස්මාර්ක් | E මව සහ පුතා |

1. EDACB 2. EADCB 3. ECDBA
4. EBCAD 5. EDBAC (.....)

21.

| X | Y |
|---|---|
| 1. ප්‍රංශය | A වස්කෝද ගාමා |
| 2. ඕලන්දය | B ක්‍රිස්ටෝපර් කොළොම්බස් |
| 3. පෘතුගාලය | C ජෝන් කැබෝ |
| 4. ස්පාඤ්ඤය | D ජැක්විස් කාටියර් |
| 5. එංගලන්තය | E හෙන්රි හඩ්සන් |

1. DACBE  2. DEACB  3. DEABC
4. DAECB  5. DBACE  (.....)

22.

| X | Y |
|---|---|
| 1. හිපොක්‍රටීස් | A මිනිසා යනු දේශපාලන සත්වයෙකි. |
| 2. සීසරෝ | B මම පැමිණියෙමි, මම දුටිමි, මම ජයගතිමි. |
| 3. ඇරිස්ටෝටල් | C විප්ලවය යනු මම වෙමි. |
| 4. ජුලියස් සීසර් | D සෑම රෝගයකටම ස්වභාවික හේතුවක් ඇත. |
| 5. නැපෝලියන් බොනපාට් | E සත්‍ය වූ නීතිය යනු ස්වභාවධර්මය හා එකඟ වූ නිවැරදි හේතු යුත්කියයි. |

1. ABDEC  2. DEABC  3. DCBAE
4. BACED  5. ABCDE  (.....)

23.

| X | Y |
|---|---|
| 1. v වැනි චාල්ස් | A එංගලන්තයේ රැජින |
| 2. මෙටර්නික් | B ශුද්ධ රෝම අධිරාජ්‍යයා |
| 3. වික්ටෝරියා | C රුසියාවේ අධිරාජ්‍යයා |
| 4. ii ඇලෙක්සැන්ඩර් | D ඇමරිකා එක්සත් ජනපදයේ ජනාධිපති |
| 5. වුඩ්රෝ විල්සන් | E ඔස්ට්‍රියාවේ අගමැති |

1. DBCEA  2. AEDBC  3. DCBEA
4. BACDE  5. BEACD  (.....)

24.

| X | Y |
|---|---|
| 1. මිනර්වා | A මුහුදට අධිපති දෙවියා |
| 2. මාර්ස් | B සරුසාර අස්වැන්න අධිපති දෙවියා |
| 3. සෙරෙස් | C යුද්ධයට අධිපති දෙවියා |
| 4. ජුපිටර් | D අත්කම්වලට අධිපති දෙවියා |
| 5. නෙප්චූන් | E අහසට අධිපති දෙවියා |

1. DEBEA  2. BDCEA  3. AEBCD
4. DBCEA  5. AEDBC  (.....)

25. X | Y

| X | Y |
|---|---|
| 1. නැන්ටීස් ආඥාව | A 1789 |
| 2. බැස්ටීලයට පහර දීම | B 1914 |
| 3. පුන්‍යඵල පත්‍රිකා විකිණීම | C 1598 |
| 4. සරයේවෝ සිදුවීම | D 1517 |
| 5. ජර්මන් අධිරාජ්‍යයේ උපත ප්‍රකාශයට පත්කිරීම | E 1871 |

1. EDABC 2. DEACB 3. CADBE
4. CDAEB 5. BEADC (.....)

- **ප්‍රශ්න අංක 26 - 30 දක්වා එක් ක් ප්‍රශ්නයට දක්වා ඇති A,B, C, D යන ප්‍රතිචාර හතර අතරින් එකක් හෝ කීපයක් හෝ නිවැරදිය. එම නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර තෝරා,**

A හා B පමණක් නිවැරදි නම් අංක 1 ද
B හා C පමණක් නිවැරදිනම් අංක 2 ද
C හා D පමණක් නිවැරදිනම් අංක 3 ද
A හා C පමණක් නිවැරදිනම් අංක 4 ද

ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදිනම් අංක 5 ද වරහන තුළ ලියන්න.

| **උපදෙස් සම්පිණ්ඩනය** | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| A සහ B පමණක් නිවැරදිය. | B සහ C පමණක් නිවැරදිය. | C සහ D පමණක් නිවැරදිය. | Aහා C පමණක් නිවැරදිය. | ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදිය. |

26. එක්සත් ජාතීන්ගේ සංවිධානය ලෝක සාමය සඳහා ගත් ප්‍රයන්තයන් මොනවාද?
A) වියට්නාම් අර්බුදයට මැදිහත්වීම. B) ඉන්දු - චීන අර්බුදයට මැදිහත් වීම.
C) ඉන්දු - පකිස්ථාන් අර්බුදයට මැදිහත්වීම. D) ඉරාක කුවේට් අරගලයට මැදිහත් වීම. (.....)

27. පහත දැක්වෙන පුද්ගලයින් අතරින් වියානා සම්මේලනයට සහභාගී වූ යුරෝපීය නායකයෝ කවරහුද?
A) xvi ලුවී
B) ටැලිරෑන්ඩ්
C) කාසල්රි
D) කැනිං (.....)

28. ජාතීන්ගේ සංගමය සම්බන්ධයෙන් කවර ප්‍රකාශ / ප්‍රකාශය නිවැරදි වේද?
A) ජාතීන්ගේ සංගමයේ ව්‍යවස්ථාව ඇතුළත් වී තිබෙන්නේ පැරිස් සාම ගිවිසුමේ පළමුවන පරිච්ඡේදය වශයෙනි.
B) එහි මූලස්ථානය පිහිටා ඇත්තේ ස්විසර්ලන්තයේ ජිනීවා නුවරය.
C) එහි මධ්‍ය සංවිධානය වූයේ ආරක්‍ෂක මණ්ඩලයයි.
D) පළමු මහලේකම්වරයා වූයේ බ්‍රිතාන්‍යයේ රොබට් සිසිල් සාමිවරයායා. (.....)

29. පහත සඳහන් ඒවා අතුරින් නූතන රාජ්‍ය ක්‍රමයේ මූලික අංගෝපාංග කවරේද?
A) සියලු රාජ්‍යවල නෛතික සමානාත්මතාව හා ස්වාධීනත්වය
B) තමන්ට අභිමත විදේශ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම සඳහා සෑම රාජ්‍යකයටම ඇති අයිතිය

C) යුද්ධයට ආදේශකයක් ලෙස රාජ්‍යෝපාය ඥානය යොදාගැනීම.
D) යුද්ධ ඇතිවීම වළක්වා ගැනීමේ උපක්‍රමයක් ලෙස බල සමතුලිතතාව පවත්වාගෙන යාම. (.....)

30. (ii) ලෝක සංග්‍රාමය ඇතිවීමට බලපෑ සාධක කවරේ ද?
A) අප්‍රිකාව බෙදා ගැනීම සම්බන්ධයෙන් බ්‍රිතාන්‍ය හා ප්‍රංශය අතර ඇති වූ ගැටුම
B) වර්සායි ගිවිසුමේ දුර්වලතා
C) ඉතාලියේ ෆැසිස්ට්වාදය හා ජර්මනියේ නට්සිවාදයේ නැගීම.
D) ජාතීන්ගේ සංගමය අසාර්ථක වීම. (.....)

- **අංක 31 - 35 තෙක් සෑම ප්‍රශ්නයකටම එක් එක් මාතෘකාව යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතරින් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ එම නොගැළපෙන කරුණ තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

31. රුසියානු විප්ලවය ඇතිවීමට බලපෑ හේතු
1. දූෂිත රාජාණ්ඩුව
2. බෝල්ෂෙවික් පක්ෂයේ නැගී ඒම.
3. පළමුවන ලෝක යුද්ධයේදී රුසියාව ජර්මනිය අතින් පරාජය වීම.
4. රෝමානු කතෝලික ආගම ව්‍යාප්ත වීම.
5. දුර්වල වැඩවසම් ආර්ථික ක්‍රමය (.....)

32. නාසිවාදයේ ප්‍රතිඵලය
1. ජර්මනිය තුළ ඇති වූ දියුණුව
2. යුදෙව්වන්ට වධහිංසා පැමිණවීම.
3. දෙවන ලෝක යුද්ධයට මග පෑදීම.
4. සමාජවාදය බිහිවීම.
5. වෘත්තීය සංගම් තහනම සහ කම්කරු මර්ධනය (.....)

33. එංගලන්තයේ පාර්ලිමේන්තුවේ වර්ධනය
1. 1215 මහා අධිකාර පත්‍රය (මැග්නා කාර්ටා)
2. 1688 එංගලන්ත බැංකුව ආරම්භ කිරීම.
3. 8 වෙනි හෙන්රි විසින් පාර්ලිමේන්තුවේ සහය ඇතිව ආගමික ප්‍රතිසංස්කරණය ක්‍රියාත්මක කිරීම.
4. 1639 අයිතිවාසිකම් පිළිබඳ පනත
5. 1832 ප්‍රතිසංස්කරණ පනත මගින් ඡන්ද බලය පුළුල් කිරීම. (.....)

34. නොබැදිජාතීන්
1. මධ්‍යස්ථ විදේශ ප්‍රතිපත්තිය
2. එකිනෙකාගේ අභ්‍යන්තර කටයුතු වලට ඇඟිලි ගැසීම.
3. එකිනෙකාට විරුද්ධව ආක්‍රමණය නොකිරීම.
4. අන්‍යෝන්‍ය ප්‍රතිලාභවලදී සමානත්වය
5. සාමකාමී සහජීවනය (.....)

35. ජර්මනිය එක්සත් කිරිම.
1. සොල්වරයින් සංගමය පිහිටුවීම.
2. ප්‍රෂියාව හා ඔස්ට්‍රියාව අතර බැරුරුම් මතභේද පැවතිනි.
3. ජර්මනිය එක්සත් කිරීමේ බිස්මාක්ගේ ප්‍රයත්න අසර්ථක විය.
4. ප්‍රැන්ක්ෆර්ට් සම්මේලනය අසාර්ථක විය.
5. ප්‍රාග් ගිවිසුමෙන් පසුව උතුරු ජර්මන් සංයුක්තය පිහිටු විය. (.....)

- **36 සිට 40 දක්වා ප්‍රශ්නවල අදාළව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1, 2, 3, 4, හා 5 යන කවර ප්‍රකාශ යුගලයදැයි තෝරා ඊට අදාළ අංකය වරහන තුළ ලියන්න.**

❖ **අංක 36 සිට 40 තෙක් ප්‍රශ්නවලට අදාලව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නයට වඩාත් හොඳින් ගැළපෙනුයේ කවර ප්‍රකාශ යුගලයදැයි වගුවෙන් තෝරන්න.**

| | **පළමුවැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** |
|---|---|---|
| 1. | නිවැරදිය | වැරදිය |
| 2. | නිවැරදිය | නිවැරදිය |
| 3. | වැරදිය | වැරදිය |
| 4. | වැරදිය | නිවැරදිය |
| 5. | නිවැරදිය | නිවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදාදෙයි. |

| **පළමු වැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** |
|---|---|
| 36. ජස්ටීනියන් අධිරාජ්‍යා විසින් ක්‍රියාත්මක කරන ලද නීති ක්‍රමය ග්‍රීකවරුන්ගෙන් ලෝකය ලද විශිෂ්ටතම දායදයක් විය. | ආරෝග්‍යශාලා ක්‍රමය යුරෝපයට ලැබුණේ මුස්ලිම්වරුන්ගෙනි. (.....) |
| 37. ඉස්ලාම් ශිෂ්ටාචාරය මගින් ලෝක සාහිත්‍යයට සාහිත්‍ය කෘති රාශියක් ලැබුනි. | අල්තබාරිගේ අපොස්තලුවන්ගේ හා රජවරුන්ගෙන් වෘත්තාන්තය චරිත කථා අතර ප්‍රමුඛ වේ. (.....) |
| 38. නැපෝලියන් විසින් පළාත් පාලන බලතල අඩු කිරීමට ප්‍රතිසංස්කරණයන් ඇතිකරන ලදී. | සෝවියට් රුසියානු ආධාර ලැබූ කියුබාව 1969 දී සමාජවාදී රාජ්‍යයක් බවට පත් විය. (.....) |
| 39. ධනවාදය හා ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රචලිත කිරීමේ නායකත්වය රුසියාවට හිමි විය. | ප්‍රංශ විප්ලවය මගින් සමාජවාදී කණ්ඩායම ශක්තිමත් විය. (.....) |
| 40. එක්සත් ජාතීන්ගේ සංවිධානය ප්‍රධාන ආයතන හයකින් සමන්විත විය. | සරයේවෝ සිද්ධිය දෙවන ලෝක යුද්ධයට ආසන්න හේතුව විය. (.....) |

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

25B | S | II

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2018

**Third Term Test - Grade 13 - 2018**

විභාග අංකය .............................

යුරෝපා ඉතිහාසය II

උපදෙස්

♦ පළමු ප්‍රශ්නයටත්, තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.

01. ඔබට සපයා ඇති සිතියමෙහි පහත සඳහන් සියළුම ස්ථාන ලකුණු කොට නම් කරන්න. ඒවායින් ඔබ කැමති ස්ථාන දෙකක් පිළිබඳව කෙටි ඓතිහාසික සටහන් ලියන්න.

1. ඉංග්‍රීසි ඕඩය 2. ක්‍රිමියාව 3. ඩානල්ස් සමුද්‍ර සන්ධිය
4. නෙදර්ලන්තය 5. උතුරු මුහුද 6. සිසිලිය
7. ලිවර්පූල් 8. රයින් ගඟ

(සිතියම් ලකුණු කිරීමට 8 ඓතිහාසික සටහනකට 5 බැගින්) (8 + 5 x2 =18)

02. (i) ග්‍රීක ශිෂ්ටාචාරයේ ප්‍රධාන ලක්‍ෂණ පහත සඳහන් මාතෘකා යටතේ විමසන්න.
ආර්ථික කටයුතු
අධ්‍යාපනය
දාර්ශනික චින්තනය හා විද්‍යාව
ග්‍රීක ගෘහ නිර්මාණ ශිල්පය (ල. 14)

03. (i) 'පුනරුදය නූතන යුරෝපයේ උදාව සනිටුහන් කරයි''
01. පුනරුදය ඉතාලියෙන් ආරම්භ වීමට බලපෑ හේතු දක්වන්න. (ල.06)
02. පුනරුදයත් සමඟ ප්‍රබෝධයට ලක්වූ භාෂාව කලාව හා ගෘහ නිර්මාණ ශිල්පය ඇසුරෙන් ඉහත ප්‍රකාශය විමසන්න. (ල. 08)

04. ''යුරෝපයේ ඇති වූ රෙපරමාදු ව්‍යාපාරයේ අවසාන ප්‍රතිඵලය වූයේ ආගමික විප්ලවයකි.'
(i) රෙපරමාදු ව්‍යාපාරයට තුඩුදුන් හේතු දක්වන්න. (ල. 7)
(ii) රෙපරමාදු ව්‍යාපාරයේ ප්‍රතිඵල ඇසුරින් ඉහත ප්‍රකාශය විමසන්න. (ල. 7)

05. 'ඇමරිකානු නිදහස් සටන ඇමරිකාව සම්බන්ධයෙන් පමණක් නොව යුරෝපය සම්බන්ධයෙන් ද දැඩි බලපෑමක් ඇති කරනු ලැබීය'
(i) ඇමරිකානු නිදහස් සටනේ ප්‍රධාන සටන් පාඨය කුමක්ද? (ල. 1)
(ii) ඉංග්‍රීසි ආණ්ඩුව විසින් උතුරු ඇමරිකාවේ අනුගමනය කරන ලද යටත් විජිත ප්‍රතිපත්තිය කෙසේ සකස් වී තිබුනේද? (ල. 6)
(iii) ඇමරිකානු නිදහස් සටනෙහි ප්‍රතිඵල ඇසුරෙන් ඉහත ප්‍රකාශය පරීක්ෂා කරන්න. (ල. 7)

06. නැපෝලියන්ගේ ප්‍රතිසංස්කරණ ප්‍රංශ ජාතිකත්වය ගොඩනැගීමට 'දායක වූ අයුරු විමසන්න. (ල.14)

07. 'ජර්මනිය එක්සත් කළ හැකි වන්නේ ලේ සහ යකඩ ප්‍රතිපත්තියකින් පමණක් බව බිස්මාක්ගේ පිළිගැනීමය විය' / ජර්මනිය එක්සත් කිරීමේ ව්‍යාපාරය සම්බන්ධයෙන් මේ කියමන අදාළ වන අයුරු පරීක්ෂා කරන්න. (ල. 14)

08. 'ප්‍රංශය හුදෙකලා කිරීම සඳහා ජර්මනිය අනුගමනය කළ ක්‍රියා කලාපය පළමුවන ලෝක මහා සංග්‍රාමය කරා යුරෝපය යොමු කිරීමට හේතු විය'' මෙම කියමන පරීක්ෂා කරන්න. (ල. 14)

09. එක්කෝ A කොටසට නැතහොත් B කොටසට පමණක් පිළිතුරු සපයන්න.


(A) 1917 රුසියන් විප්ලවය ඇතිවීමට බලපෑ දේශපාලන, ආර්ථික, සමාජීය හේතු විග්‍රහ කරන්න. (ල. 14)

(B) පහත දැක්වෙන මාතෘකා අතුරෙන් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) පැසිස්ට්වාදය
(ii) එක්සත් ජාතීන්ගේ සංවිධානය
(iii) නව අධිරාජ්‍යවාදය
(iv) මයිකල් ආන්ජිලෝ
(v) 1688 විප්ලවය (ල. 7 x 2) (ල. 14)

**12 / 13 යුරෝපා ඉතිහාසය** - 12 / 13 ஐரோப்பிய வரலாறு

| | |
|---|---|
| විභාග අංකය<br>சுட்டெண் | |




**තෙවන වාර පරීක්ෂණය 2018 -යුරෝපා ඉතිහාසය.**
**පිළිතුරු 13 - ශ්‍රේණිය 1 කොටස**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | 1 | 11. | 5 | 21. | 3 | 31. | 4 |
| 2. | 5 | 12. | 3 | 22. | 2 | 32. | 4 |
| 3. | 4 | 13. | 5 | 23. | 5 | 33. | 2 |
| 4. | 4 | 14. | 2 | 24. | 1 | 34. | 2 |
| 5. | 5 | 15. | 3 | 25. | 3 | 35. | 3 |
| 6. | 4 | 16. | 2 | 26. | 5 | 36. | 4 |
| 7. | 2 | 17. | 1 | 27. | 2 | 37. | 5 |
| 8. | 1 | 18. | 1 | 28. | 1 | 38. | 2 |
| 9. | 4 | 19. | 3 | 29. | 5 | 39. | 3 |
| 10. | 5 | 20. | 5 | 30. | 5 | 40. | 1 |

(ලකුණු 40)

**<u>11 පත්‍රය - පිළිතුරු</u>**



01. නිවැරදි සිතියම් ලකුණු කිරීමට ලකුණු 08
ඓතිහාසික සටහන් ලකුණු 10
18

02. (i) **ආර්ථික කටයුතු,**
* ප්‍රධාන ජීවනෝපාය ගොවිතැන වීම.
* සමහර ප්‍රදේශ නිසරු නිසා සමාන ලෙස කෘෂිකාර්මික කටයුතු කළ නොහැකි වීම.
* ධීවර කර්මාන්තයටද ප්‍රධාන තැනක් හිමිවීම. * විදේශ වෙළඳාම
* මැටි කර්මාන්තය ද පැවැතීම. * වහල් සේවය
* ස්වභාවික සම්පත් ලෙස රිදී බහුලව පැවතීම / පතල් කර්මාන්තය

(ii) **අධ්‍යාපන**
* පෞද්ගලික පාසැල් හා පෞද්ගලික ගුරුවරුන්
* ප්ලේටෝයේ ඇකඩයමි / ඇරිස්ටෝටල්ගේ ලයිසියම්
* සොෆිස්ට් නම් ගුරුවරු
* සෑම පිරිමියෙකුම යුධ පුහුණුව ලබාගත යුතුවීම.

(iii) ග්‍රීක ගෘහ නිර්මාණ ශිල්පය
* පෙරික්ලීස් යුගය ග්‍රීක කලාවේ දියුණුව යුගය විය.
* හුණුගල් හා කිරිගරුඬ ගොඩනැගිලි
* පාතිනන් දෙව් මැදුර
* ඩොරික් සම්ප්‍රදාය (ල. 14)

03. (i) අභ්‍යන්තර හා බාහිර සාධක විමසිය යුතුවේ.
**අභ්‍යන්තර සාධක**
* යුරෝපයේ අර කවර ප්‍රදේශයකවත් නොතිබුණු සම්භාව්‍ය සම්ප්‍රදායක් ඉතාලියේ ශේෂව පැවතීම.
* ඉතාලි විශ්ව විද්‍යාල වල නීතිය, වෛද්‍ය විද්‍යාව වැනි ලෞකිකත්වයට හා තර්කනයට වැඩි අකාශයක් පැවතීම.
* ඉතාලිය තුළ පැවති සමාජ, ආර්ථික, පසුබිම
* වෙළඳ වානිජ කටයුතු වර්ධනය වීම. * ධනවත් මධ්‍යම පන්තියක් වර්ධනය වීම.
* ධනවතුන් කලා කටයුතු වලට අනුග්‍රහ දැක්වීම. * කලා රසවින්දනය සඳහා විවේකය හා හැකියාව තිබීම.
* පාප් වහන්සේලාද කලාකරුවන්ට අනුග්‍රහ දැක්වීම. (ල. 6)

**බාහිර සාධක**
* කොන්ස්තන්තිනෝපලයේ තිබූ දැනුම හා ඥානය ඉතාලියට විසරණය වීම.
* 1452 දී කොන්ස්තන්තිනෝපලය තුර්කීන් අතට පත්වීමෙන් මෙම ක්‍රියාවලිය වේගයෙන් වීම.
* පුළුල් ලෙස ග්‍රන්ථ අධ්‍යනය කිරීමට මුල පිරීම.

(ii) * ග්‍රීක ලතින් භාෂා අධයනය හා භාවිතය * සම්භාව්‍ය සාහිත්‍යයේ පුනර්ජීවණය
* කලාව ස්වභාවිකත්වය හා ලෞකිකත්වයට නැඹුරු වීම.
* මානවවාදය නැගී ඒම.
* ගෘහනිර්මාණ ශිල්පය, මූර්ති, හා චිත්‍ර යන අංගවල ඇති වූ ප්‍රබෝධය
* ග්‍රීක රෝම ආභාෂය
* ප්‍රකට පුනරුද කලාකරුවෝ සහ කණී මේවා උදාහරණ සහිතව විස්තර කරන්න. (ල. 8)

04. (i) * පුනරුදය * බුද්ධි ප්‍රබෝධය * මුද්‍රණ යන්ත්‍රය බිහිවීම. * නව රාජාණ්ඩු බිහිවීම. * පල්ලිය ඉතා ධනවත් වීම. උදාහරණ සහිතව විස්තර කරන්න. (ල. 7)

(ii) ලූතර් විසින් ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයක් ලෙස ආරම්භ වූ රෙපරමාදු ව්‍යාපෘතිය පසුව ආගමික විප්ලවයක් ලෙස පැතිරුණි. මේ නිසා යුරෝපයේ ප්‍රබලව පැවති ක්‍රිස්තු සභාවේ බලය අඩු විය. එසේම ලූතර්, කැල්වින්, ස්විංග්ලි වැනි විවිධ වූ නිකායන් ඇති විය. (ල. 7)

05. (i) නියෝජිතයන් නැතිනම් බදුන් නැත. (ල.01)

(ii) * වෙළඳාම සම්බන්ධයෙන් තීරු බදු පැනවීම් බලය එංගලන්ත පාර්ලිමේන්තුව සතු විය.
* ජනපදවල පවත්නා අනපනත් ක්‍රියාත්මක කිරීමට එංගලන්තයේ අනුමැතිය අවශ්‍ය විය.
* විධායක බලය එංගලන්තය සතු වූ අතර අධිකරණය එංගලන්තයේ පැවති ක්‍රමයට සකස්ව පැවතිණි.
* ආර්ථික ප්‍රතිපත්ති වානිජවාදී න්‍යායකට සකස්විය.
* ආර්ථික ප්‍රතිපත්ති උදාහරණ සහිතව දක්වන්න. (ල.6)

(iii) * බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ අවසාන ලකුණු කිරීම හා බ්‍රිතාන්‍ය අධිරාජ්‍ය ප්‍රතිපත්ති වෙනස් වීම.
* බ්‍රිතාන්‍යයෙන් ස්වාධීනත්වය දිනාගත් ප්‍රථම රාජ්‍ය ඇමරිකාව වීම.
* ප්‍රජාත්‍රවාදී මූලධර්ම පිළිගත් ෆෙඩරල් සමූහාණ්ඩුවක් ඇතිවීම.
* මූලික මිනිස් අයිතිවාසිකම් සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම සම්පාදකයන් සැලකිලිමත් වීම.
* පසුකාලීන දේශපාන සිදුවීම් කෙරෙහි බලපෑම උදා:- ප්‍රංශ විප්ලවය
* දකුණු ඇමෙරිකාවේ ස්පාඤ්ඤ හා පෘතුගීසි විරෝදී නිදහස් සටන් ව්‍යාපාර (ල.7)

06. (i) නැපෝලියන්ගේ දේශීය ප්‍රතිසංස්කරණ දැක්විය යුතුය.
* විධායක බලතල තමා වෙත ඒකරාශිකර ගැනීම.
* බොනපාට්වාදය තහවුරු කිරීම.
* දක්ෂතාවයමත තනතුරුවලට පත්වීම.
* ජනමත විචාරණයක් පැවැත්වීම.
* සංකේන්ද්‍රගත පාලනය
* පලාත් පාලන බලතල අඩු කිරිම.
* අධ්‍යාපන ක්ෂේත්‍රයේ දියුණුවක් ඇතිකිරීම.

* අධ්‍යාපනය සීමා කිරීම.
* ආගමික සහජීවනය පවත්වාගෙන යාම.
* නැපෝලියානු නීති සංග්‍රහය
* පොදු අධිකරණ ක්‍රමය / බැංකු ක්‍රම/ මූල්‍ය ක්‍රම
* කර්මාන්ත ඇතිකිරීම / ලූවි කෞතුකාගාරය / ප්‍රවාහන ක්‍රම
* පුවත්පත් පාලනය / නම්බුනාම ප්‍රදානය (ල.14)

07. (i) * ජර්මනියට ජාතික හැඟීමක් ලැබුනේ නැපෝලියන්ගෙනි.
* පාලන ප්‍රදේශ 38 ක් බවට පත් කරන ලදි.
* ඔස්ට්‍රියාව හා ප්‍රශියාව විටින් විට එක්සත් ජර්මනියක් ලබා ගැනීමට උත්සහා කළ ද අසාර්ථක විය.
* 1830 විප්ලවය හා කාදුන්ක් ෆාර්ට් පාර්ලිමේන්තු
* විලියම් රජු බවට පත්වීම.
* බිස්මාක් ඩාන්සලර් වීම.
* සෙල්වරයින් තීරු බදු සංගමය පිහිටුවීම.
* දක්ෂ හමුදාවක් සෑදීම.
* ඩෙන්මාකයට විරුද්ධව ඔස්ට්‍රියාව සමඟ එකතු වී හොල්ස්ටයින් ෂෙල්එවිග් ලබා ගැනීම.
* ඔස්ට්‍රියාව සමඟ යුද්ධකොට 1866 දී ජය ගැනීම.
* උපක්‍රමශීලිව ප්‍රංශයට ඇදා ගැනීම.
මෙම සිදුවීම් විස්තර කර දක්වන්න. (ල. 14)

08. (i) ඔස්ට්‍රියාව හා ප්‍රංශය ඒකාබද්ධ ගොඩ නැගණු ජර්මන් අධිරාජ්‍යයට විරුද්ධව ප්‍රංශය තිස් අවුරුදු යුද්ධ කාලයේ පවා ක්‍රියා කළේය.
ජර්මනියේ හැප්න්බර් වංශය හා ප්‍රංගබූර්බෝන් පෙළපත අතර පැවති අරගලය තිස් අවුරුදු යුද්ධයට සම්බන්ධවීම.
ජර්මනියේ ඇල්කස් ලෝරේන් තෙල්කොත් ප්‍රංශයට ලබාගැනීමත් සමඟ මෙම ආරවුල දිස් ගැස්සීම.
1871 දී නැවත ඇල්සාස් ලෝරේන් ප්‍රදේශය තනිකිරීමේ ප්‍රතිපත්තියක් අනුගමය කිරීම.
නමුත් එය අසාර්ථ විය (නව චාන්කලර්වරයාගේ ක්‍රියාකලාවය)
නව චාන්සලර්වරයා යුරෝපයේ යටතේ විජිත ඇති කර ගැනීමට යොමුවිය.
මෙය බලවත් රටවල අවධානයට යොමු වීම ප්‍රංශයට වාසි සහගත විය.
ජර්මනියට යුද ආයුධ වලින් සන්නන්ධ වීම දෙස අනෙක් රටවල් සැකෙයෙන් බැලීමට පුරුදු විය.
ප්‍රංශය අවට රටවල් සමඟ සම්බන්ධතා ගොඩ නැගීමට සූදානමින් සිටියේය. (ල.14)

09. (A) දූෂණයෙන් පිරුණු ආකාර්යක්ෂම ඒකාධිපති පාලන ක්‍රමය
වැඩවසම් සමාජ ආර්ථික රටාව
ක්‍රිමියන් යුද්ධයට සම්බන්ධ වී විශාල ධනයක් අහිමි වීම.
ජපානය සමඟ යුද්ධකිරීම
I ලෝක යුද්ධයට සම්බන්ධ වී පරාජය වීම.
ජනතාවටද යුද්ද කටයුතු සඳහා ඉදිරිපත්වීමට සිදුවීම. (ල. 14)

(B) අදාළ පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න. (ල. 7 x 2)